# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට සහ ආසියා ශාන්තිකර කලාපයේ විශාලතම බැංකු 500 අතරට ශ්‍රේණිගත කර ඇති, ශ්‍රී ලංකාවේ "අංක 01" රාජ්‍ය වාණිජ බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුර සඳහා අදාළ සුදුසුකම් ඇති පළපුරුද්ද සහ කැපවීම සහිත උද්යෝගිමත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# අභ්‍යාසලාභී ලේකම් සහායක

## යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**

➢ **සුදුසුකම්**

- අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එකවර සමත්වී තිබීම.

**සහ**

- අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී විෂයයන් දෙකක් (02) (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනුම හැර) එකවර සමත් වී තිබීම.

**සහ**

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි ඕනෑම පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද ලේකම් පරිචය පිළිබඳ අවම වශයෙන් මාස හයක (06) ඩිප්ලෝමා / සහතික පත්‍ර පාඨමාලාවක් (ඉංග්‍රීසි මාධ්‍යය) සමත් වී තිබීම.

➢ **වෙනත් සුදුසුකම්**

- ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂා ලිඛිත සහ කථනය පිළිබඳ මනා දැනුමක් තිබීම.
- පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍යයි.
- පරිගණක (ඉංග්‍රීසි) යතුරු ලිවීමේදී විනාඩියකට වචන 40 ක වේගයක් තිබීම.

➢ **වයස**

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වනවිට වයස අවුරුදු 40 හෝ ඊට අඩු විය යුතුය.

## නියමයන් සහ කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් (02) වන අතර මෙම පුහුණු කාලසීමාව තුළ මාසික දීමනාවක් (1 වන වසර සඳහා - රු. 25,000/- සහ 2 වන වසර සඳහා - රු. 28,000/-) ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත්වන නමුත් සාමාන්‍ය බැංකු සේවා ප්‍රවාහයෙන් පරිබාහිර (සංවෘත සේවය) වේ.
- පුහුණු කාලසීමාව තුළ බැංකුව සෑහීමට පත්වන පරිදි අවශ්‍යතා සපුරාලීම මත ස්ථිර සේවයේ ලේකම් සහායක - 1 ශ්‍රේණියෙහි ස්ථිර කරනු ලැබේ.
- කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත / නිවාඩු දිනයන්හි සේවය කිරීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාව පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

## තෝරා ගැනීමේ පටිපාටිය

පරිගණක වේග පරීක්ෂණයක් සහ ඉන් අනතුරුව ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

ඔබගේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("careers" තීරය හරහා) 2021 ජූනි මස 05 වන දින හෝ ඊට පෙර එවිය යුතු අතර "අයදුම්පතෙහි යොමු අංකය" ඔබේ අනාගත පරිශීලනය සඳහා සුරැකිව තබාගන්න.

ඉහත ඉල්ලුම් කිරීමේ පටිපාටියට අමතරව වෙනත් කිසිදු මාර්ගයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.

ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් රහිත හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් කිසිදු දැනුම් දීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය,**
**කොළඹ 01.**

**කුමන අයුරකින් හෝ බලපෑම් සිදුකිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතුවනු ඇත.**

**තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුවේ.**

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ